www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුරුම හමුදාව විරෝධතාකරුවන් වෙඩි තබා ඝාතනය කරයි

## Burmese troops gun down protestors

**සුජීව අමරනාත් සහ පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2007 සැප්තැම්බර් 29**

පසුගිය දින දෙක තිස්සේ බුරුම මිලිටරි තන්ත්‍රය, කඳුලු ගෑස්, බැටන් ප්‍රහාර, රබර් උන්ඩ හා ජීව උන්ඩ යොදා ගෙන ජන සේනා බිඳ දමමින්, රැන්ගුන් හා මන්ඩලේ යන ප්‍රධාන නගරවල දැවැන්ත ජුන්ටා-විරෝධී විරෝධතාවන්ට එරෙහි මෘග මර්දනයක් ගෙන ගොස් ඇත. බ්‍රහස්පතින්දා පැවති ගැටුම්වලින් පුද්ගලයන් නව දෙනෙකු මිය ගිය බවට රාජ්‍ය මාධ්‍ය වාර්තා කල නමුත් ක්‍රියාකාරීන්, රාජ්‍ය තාන්ත්‍රිකයන් හා අතලොස්සක් පමන වන විදේශීය මාධ්‍යවේදීන් වෙතින් ලැබුනු වාර්තා මගින් යෝජනා කෙරුනේ එම සංඛ්‍යාව ඊට වඩා සැලකිය යුතු අයුරින් ඉහල අගයක් විය හැකි බව යි.

හමුදාව රැන්ගුන් නුවර ෂ්වෙඩගොන් විහාරය හා සුලේ විහාරය ඇතුලු ආරාමවලට කඩා පැන බෞද්ධ භික්ෂූන් සිය ගනනක් අත් අඩංගුවට ගනිමින් ක්‍රියාවට දැමූ මර්දනය බදාදා රාත්‍රියේ හා බ්‍රහස්පතින්දා අලුයම ඇරඹුනි. විරෝධතාකරුවන් එක්රැස් වීම වලකනු පිනිස විරෝධතාවයේ මධ්‍යස්ථාන ලෙස පැවති ප්‍රධාන ආරාම පහක් තහනම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කොට ඒවාට සීල් තබන ලදි.

එක් අවස්ථාවක දී, බදාදා රාත්‍රියේ සොල්දාදුවෝ රැන්ගුන් අසල උප නගරයක් වන දකුනු ඔක්කලාපාහින්ග්වේ ක්යාර් ආරාමයට බලාත්කාරයෙන් කඩා පැන භික්ෂූන් 100ක් පමන අත් අඩංගුවට ගත්හ. දහස් ගනන් ජනයා අසල වීදිවලට රැස් වී හමුදා භටයන්ට ගල් මුල් එල්ල කිරීමට පටන් ගත්හ. සොල්දාදුවන් ස්වයංක්‍රීය අවිවලින් වෙඩි තැබූ කල උසස් විද්‍යාල සිසුවකු ඇතුලු අට දෙනෙක් ජීවිතක්ෂයට පත් විය.

බ්‍රහස්පතින්දා 70,000ක් පමන ජනයා මිලිටරියේ තහනම උල්ලංඝනය කරමින් රැන්ගුන් නගරයේ පෙලපාලි දැක්වී ය. මන්ඩලේ සහ සිත්වේ, පකොකු හා මොවුල්මෙයින් ඇතුලු සෙසු මධ්‍යස්ථානවලත් විරෝධතා පැවති බව වාර්තා විය. මධ්‍යම රැන්ගුන්හි සුලේ විහාරය අසල හමුදා හා පොලිස් ට්‍රක් රථ 20ක් යොදවා මාර්ග බාධක ඉදි කෙරුනි. විරෝධතාකරුවන් ගල් හා බෝතල්වලින් දමා ගැසූ කල ආරක්ෂක හමුදාවෝ වෙඩි හා කඳුලු ගෑස් ප්‍රහාර මගින් ප්‍රතිචාර දැක්වූහ. මිලිටරිය ජනතාවට විසිර යාමට විනාඩි 10ක කාලයක් දී ඉන් පසුව වෙඩි තැබීම ආරම්භ කල බව ඇසින් දුටුවෝ පැවසූහ.

ගැටුම් ඡායාරූප ගත කරමින් සිටි 50 හැවිරිදි කෙන්ජි නගෙයි නම් ජපාන ජාතික මාධ්‍යවේදියා ද මිය ගිය අය අතර විය. අහක ගිය උන්ඩයක් වැදී ඔහු මිය ගිය බවට රාජ්‍ය මාධ්‍ය කියා පෑවත් ජපානයේ ෆූජි රූපවාහිනියේ විකාශනය කෙරුනු ආධුනික වීඩියෝ පටයක පෙන්නුම් කෙරුනේ ඔහුට හිතා මතාම වෙඩි තැබූ ආකාරය යි.

ඊයේ පැවති විරෝධතා පිලිබඳ වාර්තා ඇත්තේ මඳ වසයෙනි. රටේ ප්‍රධාන අන්තර්ජාල සම්බන්ධතාව කපා දමා තිබුනි. ඒ හේතු කොට ගෙන, පෙර දිනවල පිටත ලෝකය වෙත ලඟා වෙමින් තිබූ ඡායාරූප, විඩියෝ හා වාර්තා ප්‍රවාහය නතර කෙරුනි. ජංගම දුරකතන ජාලය ද ක්‍රියාත්මක නොවී ය. මුහුද යටින් දිවෙන කේබලයකට හානි සිදුව ඇතැයි නිලධාරින් වාර්තා කලත් හමුදා ජෙනරාල්වරු වාරනයක් සඳහා අන දුන් බවට සැකයක් නැති තරම් ය.

ලන්ඩනයේ පාදක ටයිම්ස් පත්‍රයේ වාර්තාකරුවෙක් සුලේ විහාරය අසල පැවති කුඩා විරෝධතා ගැන ද මනා ලෙස සන්නද්ධ ආරක්ෂක හමුදාවන් සමග තරුන විරෝධතාකරුවන් ගැටුනු ආකාරය ද විස්තර කලේ ය. "එදා රැන්ගුන් නුවර තිබුනේ කාලකන්නි මුස්පේන්තු වාතාවරනයක්. බැටන් ප්‍රහාර, පහර දීම් හා ඊටත් වඩා දරුනු සිද්ධීන් පිලිබඳ කටකතාවිලින් යුක්ත දිනයකි සොල්දාදුවන් තුවක්කු මානා ගෙන, තද රබර් උන්ඩවලින් නොනවත්වා වෙඩි තබමින් ලුහු බඳිමින් පුද්ගලයන් අත් අඩංගුවට ගන්නා ආකාරය මම දුටුවෙමි." යැයි ඔහු ලිවී ය.

ඊයේ මධ්‍යම රැන්ගුන්හි පැවති විරෝධතාවලට 10,000 දක්වා වූ පිරිසක් සහභාගි වු බවත් ඔවුන් යලි යලිත් හමුදාව හා පොලීසිය සමග ගැටුනු බවත් ප්‍රන්ස ප්‍රවෘත්ති සේවය වාර්තා කලේ ය. 500ක පමන වෙනම කන්ඩායමක් වීදි දිගේ පෙලපාලි දැක්වූ අතර දෙපස බලා සිටි ජනයා ඔවුන්ට හරසර දැක්වූහ. මන්ඩලේ නගරයේ දී, ආරක්ෂක හමුදාවන් විසින් ඉදි කරන ලද

මාර්ග බාධකයක් දෙසට යතුරු පැදිවල නැගුනු තරුනයන් 1000ක් පමන කඩා වැදුනු නමුත් ඔවුන් ආපසු තල්ලු කොට හරින ලදි.

අවුං සාන් සූ කිගේ නායකත්වයෙන් යුත් ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ලීගයේ (එන්එල්ඩී) සාමාජිකයන් ඇතලු විපාර්ශ්වික නායකයන් අත් අඩංගුවට ගැනීම තව දුරටත් සිදු වේ. එන්එල්ඩී නිලධාරියකු මාධ්‍යවලට පැවසුවේ, පක්ෂයේ ප්‍රමුඛ නායකයන් දෙදෙනකු වන හ්ලා පේගේ සහ මයින්ට් තේගේ නිවාසවලට කඩා වැදී ඔවුන් අත් අඩංගුවට ගත් බව යි. ජුන්ටාවට එරෙහි 1988 විරෝධතා ව්‍යාපාරයේ සටන්කරුවන් විසින් පසුගිය වසරේ පිහිටුවන ලද සංවිධානයක් වන 88 පරම්පරාවේ ශිෂ්‍යයෝ කන්ඩායමේ සාමාජිකයන් ද අත් අඩංගුවට ගෙන රඳවා ගෙන සිටී.

## ජාත්‍යන්තර කුහකකම

ජුන්ටාව සමග ගැටෙමින්, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ වඩා හොඳ ජීවන කොන්දේසි ඉල්ලා සිටීමෙහි ලා ශිෂ්‍යයන්, තරුන භික්ෂූන් සහ සාමාන්‍ය ජනයා දැවැන්ත ධෛර්‍යයක් පෙන්නුම් කර තිබේ. කෙසේ වෙතත්, විරෝධතා ව්‍යාපාරයේ දේශපාලන ඉදිරිදර්ශනයේ පවතින සීමිත ස්වභාවය, එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා ප්‍රධාන බලවතුන්ට මැදිහත් වන ලෙස කරන ආයාචනා මගින් අවධාරනය කෙරෙයි.

එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ්, බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන් සහ සෙසු නායකයන් ජුන්ටාව හෙලා දැකීම මගින් ඔවුන්ගේ කුහකකම පෙන්නුම් කෙරෙයි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් ගැන ගත් කල, බුෂ් පාලනාධිකාරයට සහ එහි සගයන්ට, එක්සත් ජනපද මිලිටරිය සිය අඛන්ඩ මිලිටරි වාඩිලෑමට එරෙහි මහජන විරුද්ධත්වය මැඩීමෙහි ලා සිය බුරුම සමයන් මෙන් ම ක්ෂමාවිරහිත ආස්ථානයක් ගෙන ඇති ඉරාකයේ දීට වඩා වැඩි උත්සුකතාවක් බුරුමයේ දී නැත.

වොෂිංටනය බුරුම ජුන්ටාවට විරුද්ධ වන්නේ එය ප්‍රජාතන්ත්‍ර අයිතීන් මඩින නිසා නොව චීනය සමග එය ගෙන යන සමීප සන්ධානය නිසා ය. පසුගිය සතිය මුලුල්ලේ ම, විශේෂයෙන් ම ඇමරිකානු මාධ්‍ය, ජුන්ටාවේ ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන්, ප්‍රමානවත් තරම් තදබල ක්‍රියාමාර්ග ගැනීමට බෙයිජිං තන්ත්‍රය අසමත් වීම මත වරද පැටවීමේ උත්සාහයක යෙදී ඇත. නිදසුනක් ලෙස, බ්‍රහස්පතින්දා වොෂිංටන් පෝස්ට් කතුවැකියක ශීර්ෂ පාඨය වූයේ" බුරුමය ගලවා ගනු: චීනය සහ රුසියාව භික්ෂූන් ඝාතනයකට කොල ආලෝක සංඥාව දෙයි ද?" යන්න යි. බුරුමයේ ප්‍රචන්ඩ ක්‍රියා හෙලා දකින එක්සත් ජාතීන්ගේ යෝජනාවක් වලකාලීම සම්බන්ධයෙන් එය මෙම බලවතුන් දෙදෙනා විවේචනය කලේ ය.

චීනය සහ රුසියාව සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා ඉදිරියට ගෙන යනු පිනිස මර්දනකාරී තන්ත්‍රයන්ට නරුම ලෙස සහයෝගය දෙන බවට කිසිදු සැකයක් නැත. බුරුමය සම්බන්ධයෙන් ගත හොත්, ඉන්දියාව, ජුන්ටාව පිලිබඳ සිය විවේචන නිහඬව අතහැර දමා එම රට තුල සිය ආර්ථික හා රාජ්‍යතාන්ත්‍රික ආනුභාවය වර්ධනය කර ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටී. බුරුමයේ විශාලත ම වෙලඳ හවුල්කරු වන්නේ චීනය නොව, එක්සත් ජනපදයේ වක්‍ර සහයෝගය සහිත මිලිටරි ආඥාදායකත්වයක් මගින් පාලනය කරනු ලබන අසල්වැසි තායිලන්තය යි. බුරුමය සම්බන්ධයෙන් බුෂ් පාලනාධිකාරය ගෙන යන උද්ඝෝෂනය මෙහෙයවනු ලබන්නේ සාමාන්‍ය බුරුම ජනයා පිලිබඳ කිසියම් උත්සුකතාවකින් නො වේ. ඒ වෙනුවට එහි එල්ලය වන්නේ චීනය වටලෑමේ සිය මූලෝපායික වැඩපිලිවෙලේ කොටසක් ලෙස රැන්ගුන්හි එක්සත් ජනපදයට හිතවත් තන්ත්‍රයක් පිහිටුවීම යි.

එපමනක් නොව, විරෝධතා දැක්වීම් හා පෙලපාලි වඩා රැඩිකල් දිශාවක් ගැනීම ඇරඹුන හොත් විරෝධතාකරුවන් වෙත දැන් ලැබෙන මාධ්‍ය අනුග්‍රහය ශීඝ්‍රයෙන් වෙනස් වනු ඇති බවට පහසුවෙන් ම අනාවැකි කිව හැකි ය. කම්කරු ජනතාවගෙන් සැලකිය යුතු කොටස් සම්බන්ධ වූ 1988 විරෝධතා මෙන් නොව, වත්මන් විරෝධතා දැක්වීම් තුල විශාල වසයෙන් ආධිපත්‍යය දරා ඇත්තේ භික්ෂූන් හා ශිෂ්‍යයන් ය. වැඩ කරන ජනයාගේ සැලකිය යුතු කොටස් දේශපාලන ක්‍රියාවන්ට අවතීර්න වීම ජුන්ටාව සොලවාලනු ඇතිවා පමනක් නොව, කලාපය පුරා හා ජාත්‍යන්තරව රාව ප්‍රතිරාව දනවනු ඇත.

බුරුම ජුන්ටාව ක්‍රියා කරන්නේ මහත් ශක්තියකින් නොව දුර්වල පදනමක් මත ය. ජනගහනයේ බහුතරයක වෛරයට ලක්ව ඇති ජෙනරාල්වරු ප්‍රගාඪ ආර්ථික අර්බුදයකට මුහුන දී සිටිති. සාගර ප්‍රදේශවල ගෑස් බිම් වර්ධනය වී තිබුනත් ආර්ථිකය, සියයට 20ක වාර්ෂික අනුපාතයකින් වැඩෙතැයි තක්සේරු කෙරෙන උද්ධමනයකින් ද දරුනු ආයෝජන හා විදේශ විනිමය හිඟයකින් ද පෙලෙයි. ආර්ථික විශ්ලේෂකයෝ ඉහල වර්ධන අනුපාතික පිලිබඳ නිල කියාපෑම් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් සැක පල කරති. 2003 දී, පුද්ගලික බැංකු පද්ධතිය අර්බුදයකට මුහුන පා හා ප්‍රධාන භෝග හයක අපනයනය තහනම් කර තිබිය දී පවා, ජුන්ටා තන්ත්‍රය සියයට 5.1ක වර්ධනයක් ප්‍රකාශයට පත් කලේ ය.

ජෙනරාල්වරුන්ගේ අති සුඛෝපභෝගී ජීවන චර්යාව සහ ජනගහනයෙන් බහුතරයක් මුහුන දෙන දරිද්‍රතාව අතර පරතරය ශීඝ්‍රයෙන් වැඩෙමින් පවතී. ජනගහනයෙන් සියයට 90කට අධික පිරිසක් ජීවත් වන්නේ වසරකට කියාට් 300,000කට (එ.ජ. ඩොලර් 300ක් පමන) වඩා අඩු ආදායමක් මත ය. අවුරුදු පහට අඩු ලමුන්ගෙන් සියයට 43ක් මන්දපෝෂනයෙන් පෙලෙන බවට තක්සේරු කෙරෙයි. සාමාන්‍යයෙන්, පවුලක ආදායමෙන් සියයට 70කට ආසන්න ප්‍රමානයක්

වැය කෙරෙන්නේ ආහාර සඳහා ය -- එනම්, එදා වේල පිරිමසා ගැනීමේ පැවැත්මකි. සෞඛ්‍ය සේවාව හා අධ්‍යාපනය සඳහා වැය කෙරෙන්නේ දල දේශීය නිෂ්පාදිතයෙන් යන්තම් සියයට 1.4කි -- කලාපයේ සිටින ඊලඟ අඩුම වියදම්කරුවා වන ඉන්දුනීසියාව වියදම් කරන ප්‍රතිශතය මෙන් හරි අඩකටත් අඩු අගයකි.

මැත ම විරෝධතා ව්‍යාපාර පුපුරා ඒම සඳහා ආසන්නත ම හේතුව වූයේ ප්‍රවාහන ගාස්තු ඉහල දමමින් හා මූලික භාන්ඩවල මිල ගනන් අහස උසට නැගීමට තුඩු දෙමින් පෙට්‍රල්, ඩීසල් හා ගෑස් සඳහා පැවති මිල සහනාධාර කප්පාදු කිරීමට පසු ගිය මාසයේ දී ජුන්ටාව ගත් තීන්දුව යි. කෙසේ වෙතත්, විපාර්ශ්වික නායකයන්ගේ ප්‍රයත්නය වී ඇත්තේ ජුන්ටාව හෙලීම පිනිස සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ සමාජ අසහනය බලමුලු ගැන්වීම නොව, ඒ වෙනුවට විරෝධතා ව්‍යාපාරයේ ඉල්ලීම් හිතාමතා ම සීමා කිරීම යි.

88 පරම්පරාවේ ශිෂ්‍යයෝ කන්ඩායම සහ සමස්ත බුරුම භික්ෂු සන්ධානය පසු ගිය සතියේ නිකුත් කල ප්‍රකාශයක අඩංගු වූයේ ඉල්ලීම් තුනක් පමනිඃ එනම්. දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම, ආර්ථික යහ-පැවැත්ම සහ ජාතික සංහිඳියාව. අවුං සාන් සු කී සහ එන්එල්ඩී මෙන් ම මෙම කන්ඩායම් ද උත්සාහ කරන්නේ තන්ත්‍රය සාකච්ඡාවන්ට හා බලය බෙදා ගැනීමේ සම්මුතියකට නම්මා ගනු පිනිස විරෝධතා ව්‍යාපාර සහ ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික වැඩකටයුතු යොදා ගැනීමට යි. බුරුමය විදේශ ආයෝජකයන්ට විවෘත කිරීමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිර්දේශිත ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීම ඇතුලත් එන්එල්ඩීයේ මූලික වැඩපිලිවෙල ජුන්ටාවේ ආර්ථික පිලිවෙත් මෙන් ම සාමාන්‍ය වැඩ කරන ජනතාවට ව්‍යසනයන් ගෙන එනු ඇත.

1988 විරෝධතා ව්‍යාපාරයේ හසල සටන්කරුවන්ගෙන් සමහරෙක් එලඹ ඇති නිගමනය ලෙස පෙනී යන්නේ සිය පැරනි ඉල්ලීම් වඩා රැඩිකල් බව යි. තථ්‍ය වසයෙන් ගත් කල සත්‍ය වන්නේ එහි ප්‍රතිවිරුද්ධය යි. 1988 දී, තෙල් කර්මාන්තයේ, ප්‍රවාහන, තැපැල් හා විදුලිසංදේශ සේවාවල සහ කම්හල්වල ඇති වූ වර්ජනවල මෙන් ම පුලුල්ව පැතිර ගිය විරෝධතා ව්‍යාපාරවල බලපෑම යටතේ ජුන්ටාව වෙවුලා ගියේ ය. එය බලයේ එල්ලී ගෙන සිටීමට සමත් වූයේ 1990 මැතිවරන පැවැත්වීමට හිලව් වසයෙන් විරෝධතා අවසන් කිරීමට එන්එල්ඩීය සමග ගිවිසුමක් ඇති කර ගැනීම මගිනි. සිය පාලනය ස්ථාවර කර ගැනීමෙන් පසුව, මැතිවරනයේ ප්‍රතිඵල පහසුවෙන් ම නොතකා හැරි ජෙනරාල්වරු විපාර්ශ්වය මර්දනය කොට දිගට ම බලයේ රැඳී සිටියහ.

© www.wsws.org